# සීමාසහිත මල්වල සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය

**දුරකථන / ෆැක්ස් : 045-2229582**

# තනතුරු - පුරප්පාඩු

අප සමිතියේ පහත පුරප්පාඩු වී ඇති තනතුර සඳහා රත්නපුර දිස්ත්‍රික්කයෙන් මුළු දිවයිනෙන් යන අනුපිළිවෙලට, වසර 02 ක ස්ථිර පදිංචි වයස අවුරුදු 18 – 45 අතර (සමුපකාර සමිති සේවකයන්ට සහ සමිති අභ්‍යන්තර සේවකයන්ට වයස් සීමාව බලපාන්නේ නොලැබේ) අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් 2026.03.26 දින දහවල් 12.00 දක්වා මා විසින් කැඳවනු ලැබේ.

**තනතුර** : **ලේකම් (විධායක ශ්‍රේණිය)**

**වැටුප් ක්‍රමය** : රු. 45,000.00 - 10 X 480 - 10 X490 - 54,700.00 (මීට අමතරව සබරගමුව පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව අනුමත කර ඇති දීමනා ගෙවනු ලැබේ)

**පන්තිය** : 111

**පුරප්පාඩු සංඛ්‍යාව** : 01

මෙම තනතුර විශ්‍රාම වැටුප් සහිත තනතුරකි.

**සුදුසුකම්**

I. පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධිය ලබා තිබීම සහ පිළිගත් වාණිජ / කාර්මික ආයතනයක විධායක මට්ටමේ වසර 01 ක පළපුරුද්ද තිබීම, හෝ

II. පොල්ගොල්ල ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ / පිළිගත් ආයතනයක ඩිප්ලෝමාවක් ලබා තිබීම සහ පිළිගත් වාණිජ / කාර්මික ආයතනයක විධායක මට්ටමේ තනතුරක වසර 02 ක පළපුරුද්ද තිබීම, හෝ

III. ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලයේ කළමනාකරණය පිළිබඳ ජාතික (උසස් පෙළ) සහතිකය ලබා තිබීම හෝ සබරගමුව විශ්වවිද්‍යාලයේ සමුපකාර ව්‍යාපාර කළමනාකරණයපිළිබඳ උසස් ඩිප්ලෝමාව ලබාතිබීම හෝ සහ පිළිගත් වාණිජ / කාර්මික ආයතනයක විධායක තනතුරක වසර 03 ක හෝ මෙහෙයුම් 1 මට්ටමේ තනතුරක වසර 08 ක හෝ මෙහෙයුම් 11 මට්ටමේ තනතුරක වසර 10 ක හෝ සතුටුදායක සේවා කාලයක් තිබීම, හෝ

IV. ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ ලේකම් පරිචයය පිළිබඳ පාඨමාලාව හදාරා තිබීම සමග පිළිගත් වාණිජ / කාර්මික ආයතනයක වසර 05 ක පළපුරුද්ද තිබීම, හෝ

V. අ.පො.ස. (උසස් පෙළ) සමත් වීම සමග පිළිගත් වාණිජ / කාර්මික ආයතනයක මෙහෙයුම් ශ්‍රේණියේ වසර 15 ක පළපුරුද්ද තිබීම.

තමන් විසින් පිළියෙල කරන ලද අයදුම්පත්, උප්පැන්න සහතිකය, අධ්‍යාපන සහතික, ග්‍රාම සේවා සහතිකය, පළපුරුද්ද පිළිබඳ සහතික, හැඳුනුම්පත සහ වෙනත් සුදුසුකම් සහතික වල ඡායා පිටපත් පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

**ගරු සභාපති, සී/ස මල්වල සණස සමිතිය,**
**මල්වල හන්දිය, මල්වල, රත්නපුර.**

සම්පූර්ණ කරන ලද අයදුම්පතේ පිටපතක් "ලේකම්, සමුපකාර සේවක කොමිෂන් සභාව, සබරගමුව පළාත් සභාව, නව නගරය, රත්නපුර" යන ලිපිනයට අයදුම්කරුවන් විසින් යොමු කළ යුතුය.

ලිපි කවරයේ වම්පස උඩ කෙළවරේ ඉල්ලුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.

**ගරු සභාපති,**
**සී/ස මල්වල සණස සමිතිය.**

**දිනය : 2026.03.05**